**මධ්‍යම පරිසර අධිකාරිය - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පරිසර අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව සමස්තයක් ලෙස බැලීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 90 ඡේදය ප්‍රකාරව සමාන නොවන රේඛීය අයිතම එකට හඳුනා නොගත යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සමුච්චිත අරමුදල් ගිණුමේ රු.73,573,243 ක ශේෂය හා KOICA අතිරික්ත ගිණුමේ රු.607,981 ක ශේෂය එකට එකතු කර මධ්‍යම පරිසර අධිකාරි අරමුදල් රු.74,181,224 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මෙය 2017 වර්ෂයේ සිට මධ්‍යම පරිසර අධිකාරියේ අරමුදල් ලෙස මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර ඇති අතර 2024 වර්ෂයේදී KOICA අතිරික්ත ගිණුමේ ශේෂය ජ'නල් සටහන් මඟින් මධ්‍යම පරිසර අධිකාරි අරමුදලට මාරු කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සමාන නොවන රේඛීය අයිතම වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 46 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා පෙර වර්ෂ වැරදි එම ප්‍රමිතියෙහි 47 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, අධිකාරිය විසින් රු.16,318,474 ක් වූ පෙර වර්ෂ ගැලපුම් හර ශේෂය ප්‍රවර්තන වර්ෂයට අදාළව ගිණුම් ගත කර තිබීමෙන් ප්‍රවර්තන වර්ෂයේ රඳවාගත් ඉපැයීම් රු.16,318,474 කින් හා වගකීම් රු.3,407,742 කින් අවප්‍රමාණය වී, වත්කම් රු.19,726,216 කින් අධිප්‍රමාණය වී පවතින බවට නිරීක්ෂණය විය. | පෙර වර්ෂයන්ට අදාළ වැරදි නිවැරදි කිරීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 46 හා 47 ඡේදයන්ට අනුකූලව ඉදිරියේ දී නිසි පරිදි ගිණුම් හි දැක්වීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව අතීතානුයෝගීව නිවැරදි කළ යුතුය. |
| (ඇ) | 2020 ජූනි 01 දිනැතිව අධිකාරිය වෙත භාරදී තිබුණු පිරිවැය රු.48,397,500 ක පෞද්ගලික ප්‍රදානයක් වූ කැළණි ගඟේ තත්කාලීන ජල තත්ත්ව නිරීක්ෂණ උපකරණ සහිත මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 14 ඡේදය අනුව වත්කම් ලෙස හඳුනාගැනීම 2023 වර්ෂයේදී සිදුකර පූර්ව කාල පරිච්ඡේදයට අදාළ සමුච්චිත ක්ෂය රු.397,788 ක් අඩුවෙන් පූර්ව වර්ෂ | තත්කාලීන නිරීක්ෂණ වැඩබිම 2020.06.01 දින සිට බල පැවැත්වෙන පරිදි වත්මක් ලෙස ගිණුම්ගත කිරීම සිදු කර ඇත. මෙම වත්කමට අදාළ ක්ෂය මුදල වන රු.397,788 ක් අඩුවෙන් ගිණුම් ගත වීම 2024 වර්ෂයේ දී නිවැරදි කිරීමටත් මෙම වසරේ මහ හැරී ඇති ක්ෂය වටිනාකමට අදාළ මුදල විලම්භිත ආදායමට | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව වත්කම් භාවිත තත්ත්වයට පැමිණි දින සිට වත්කම් ලෙස ගිණුම්ගත කර ක්ෂය සහ විලම්භිත ආදායම් නිවැරදිව ගැළපුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැලපීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, වත්කමේ ජීවකාලයට අනුපාතිකව ආදායම් ප්‍රකාශයට හඳුනා ගත යුතු එම වත්කමේ පූර්ව වර්ෂ 03 ට අදාළ රු.12,517,052 ක විලම්භිත ආදායම් ගැලපුම් කර නොතිබීමෙන් එම වටිනාකමින් ප්‍රාග්ධන ප්‍රදාන අධිගණනය වී සමුච්චිත ලාභය අවගණනනය වී ඇති බවට නිරීක්ෂණය විය. 2023 අප්‍රේල් සිට එම මධ්‍යස්ථානය අක්‍රීයව පැවතීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 92 (අ) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයෙන් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිසි පරිදි ගැලපීම් කිරීමට ද කටයුතු කරමි.<br>එමෙන්ම, අධිකාරියේ ඒ ඒ අංශ වල අක්‍රිය තත්ත්වයේ පවතින වත්කම් පිළිබඳ ව විමසුම් කර ඉදිරියේ දී ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) | අධිකාරියේ පාලනයේ පවතින රුමස්සල සොබාකෙත මධ්‍යස්ථානය ඇස්තමේන්තු කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 14 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කිරීමටත්, එම මධ්‍යස්ථානයේ වහළය අළුත්වැඩියා කිරීම සඳහා පරිත්‍යාග ලෙස ලද රු.650,000 ක් හා අධිකාරිය මඟින් රු.175,534 ක් ලෙස වැය කළ රු.825,534 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 22 ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධනිත කිරීමටත්, පරිත්‍යාග මුදල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 7 අනුව වත්කම් ලෙස හඳුනා ගැනීම සඳහා අදාළ වැඩ අවසන් කිරීමේ වාර්තාව අනුව නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කර තිබිය යුතුය. මෙම වැඩ අවසන් වාර්තාව මූල්‍ය ප්‍රකාශන සහතික කළ දින තෙක් ලැබී නොතිබූ බැවින් 2023 මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ලෙස හඳුනා ගැනීම සිදු කර නැත. අදාළ වාර්තාව ලැබූ පසු වත්කම් ලෙස ඉදිරියේ දී ගිණුම් ගත කිරීමට නියමිතය. | කාර්මික නිලධාරී විසින් සහතික කරන ලද වැඩ අවසන් වාර්තාව 2023 දෙසැම්බර් 27 දිනැතිව ලැබී තිබීමෙන් ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව 2023 දී වත්කම් ලෙස හඳුනාගත යුතුය. |
| (ඉ) | 2009 - 2017 කාල පරාසය තුළ තිස් අවුරුදු බදු පදනම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් රු. 3,852,000 කට ලබාගත් ඉඩම් කොටස් 03 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 14 ඡේදය ප්‍රකාරව වත්කම් ලෙස හඳුනා ගැනීමටත්, ඊට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති රු.37,615,811 ක හිඟ බදු මුදල සහ රු.6,627,000 ක් වන සියයට 10 ක අධිභාර මුදල ගිණුම්ගත කිරීමටත් කටයුතු නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් රු.44,242,811 ක් අඩුවෙන් ද, වර්ෂයේ ලාභය රු.5,920,200 කින් හා රඳවාගත් ඉපයීම් රු.38,322,611 කින් වැඩියෙන් ද දැක්වුණි. | මෙයින් ඉඩම් කොටස් දෙකක් මේ වන තෙක් අධිකාරිය වෙත පවරා දීමක් සිදුව නොතිබූ බැවින් වත්කම් ලෙස හඳුනාගෙන නොමැත. මෙම ඉඩම් කොටස් පවරා ගැනීම සඳහා කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලැබී ඇති අතර ගෙවීමට නියමිත බදු මුදලින් කොටසක් වන රුපියල් මිලියන 9 ක බදු මුදල මේ වන විට ගෙවා ඇත. අනෙක් ඉඩම නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත භාර දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී අතර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අධිකාරියේ පාලනයේ පවතින බදුගත් ඉඩම් වත්කම් ලෙස හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අධිකාරියේ වාහන 03 ක් ඉවත් කිරීම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 84 ඡේදය ප්‍රකාරව ගැලපීම් කිරීමේදී රු.8,009,959 ක ලාභයක් ඇති වී තිබුණද, එම ඉවත් කිරීම මෝටර් රථ ඉවත් කිරීමේ ගිණුමට නිවැරදිව නොගැලපීම නිසා රු.600,390 ක අලාභයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර වාහන විකිණීමෙන් ලද රු. 8,610,349 ක්වූ ශුද්ධ මුදල් ලැබීම් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමේදී අධිකාරියේ රඳවාගත් ඉපයීම් වලට හර නොකර වාහන ඉවත් කිරීමේ ගිණුමට හර කර තිබුණි. | වත්කම ඉවත් කිරීමෙන් ලද ශුද්ධ ලැබීම් වන රු.8,610,349 අතපසු වීමකින් වත්කම ඉවත් කිරීමේ ලාභය ගණනයේ දී මඟ හැරී ඇත. ඒ අනුව මෙම වරද 2024 වසරේ ගිණුම් මඟින් නිසි පරිදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් ඉවත් කිරීම් නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (උ) | රත්නපුර කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ප්‍රමාණ පත්‍ර සකස් කිරීම සඳහා 2018 වර්ෂයේදී වැය කළ රු.1,675,350 ක් කලින් ගෙවීම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබුණු අතර රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත එම ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවා තිබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 86 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී තවදුරටත් පැහැදිලි විස්තර කිරීමක් ඇතුළත් කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඌ) | දේපළ, පිරියත හා උපකරණ තුළ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටමත් භාවිතයට ගන්නා පිරිවැය රු.383,860,426 ක් වූ අයිතම 08 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම මත සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් පිළිබඳ ඵලදායී ජීවිත කාලයන් ඇගයීමට ලක්කර නැවත වත්කම් වල අගය සංශෝධනය කිරීමේ කාර්යය 2023 අවසන් ගිණුම් සැකසීම වන තෙක් සිදු කළ නොහැකි වූ අතර මෙම වසරේ දී අදාළ කටයුතු සිදු කිරීමට නියමිතය. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (එ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 49 ඡේදය අනුව ප්‍රාග්ධන හා අයභාර ප්‍රදාන ලැබුණු වහාම අයභාර ලෙස හඳුනාගත යුතු වුවත් 2023 වර්ෂයේදී අධිකාරියට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු රු.24,915,789 කින් රු.2,465,872 ක් පමණක් අයභාර ලෙස හඳුනාගෙන ඉතිරි රු.22,449,917 ක් සමුච්චිත අරමුදල් යටතේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 49 ඡේදයට අනුකූල වන පරිදි මේ වන විට මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති ප්‍රාග්ධන හා අයභාර ප්‍රදාන ගිණුම් ශේෂ සමාලෝචනයකට භාජනය කර 2024 ගිණුම් වර්ෂයේ දී අදාළ පරිදි ගැලපීම් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ගැළපුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එසේම, ව්‍යාපෘති 05 ක් සඳහා 2023 වර්ෂය තුළ ලැබී තිබුණු රු.544,982 ක සහ පූර්ව වර්ෂයන් තුළදී ව්‍යාපෘති 15 ක් සඳහා ලැබී තිබූ රු.11,788,543 ක අයහාර ප්‍රදානයන් ද නිවැරදිව අදාළ වර්ෂයේ අයහාර ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.22,994,889 කින් අවගණනය වී තවදුරටත් අයහාර ලෙස හඳුනාගත යුතු අයහාර ප්‍රදාන රු.12,333,525 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. | | |
| (ඒ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19 හි 61 ඡේදය ප්‍රකාරව පශ්චාත් සේවා ප්‍රතිලාභ - නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් ලෙස සේවක පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ආයුගණක ශිල්ප ක්‍රම භාවිතයෙන් නිශ්චය කළ යුතු වුවත් එසේ නිශ්චය නොකර අධිකාරියේ සේවකයින් 853 දෙනෙකු සඳහා 2023 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂිත වෙන්කිරීම් රු.396,976,735 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ලබා සිටි නිලධාරින් දෙදෙනෙකුට අදාළව ද, රු.2,913,900 පාරිතෝෂිත වෙන් කිරීම් ගණනය කර තිබීමෙන් එම වටිනාකමින් පාරිතෝෂිත වෙන්කිරීම් අධිගණනය වී වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වසරේ සිට පාරිතෝෂිත වෙන් කිරීම් ගණනය සඳහා ආයු ගණක ශිල්ප ක්‍රම භාවිතා කිරීමට පියවර ගන්නා බවත් ඒ අනුව පාරිතෝෂිත වෙන් කිරීම සිදු කිරීමත් කරන බව දන්වා සිටිමු. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2021 වර්ෂයේ ප්‍රතිස්ථාපිත රු.650,000 ක වටිනාකමින් යුත් මෘදුකාංගයක්, 2011 වර්ෂයේ නොමිලයේ ලබාගත් මෘදුකාංගයක් සහ 2013, 2018 හා 2020 වර්ෂයන්හිදී අධිකාරිය විසින් සංවර්ධනය කරන ලද මෘදුකාංග /දත්ත පද්ධති 03 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 20 හි 17 හා 18 ඡේද ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | EPP System රු. 650,000 ක් 2024 වර්ෂයේ දී වත්කමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කරමි. ඉදිරියේ දී වෙනත් පාර්ශව වලින් ලද මෙවැනි පද්ධති, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනා ගැනීමෙන් පසු වත්කම් ලෙස හඳුනා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කරමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ආදායම් රු.28,120,575 ක් ගිණුම්ගත කර නොතිබීමෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම හා ලැබිය යුතු පොලී අඩුවෙන් දැක්වුණි. | ලැබිය යුතු පොලි ආදායම් ගිණුම්ගත කිරීම අතපසු වීමකින් මග හැරී තිබූ අතර එය 2024 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි ගිණුම් කාලච්ජේදයට ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | විදුලි උපකරණ ආරම්භක තොග ශේෂය ගොඩනැඟිලි අලුත්වැඩියා හා නඩත්තු කිරීමේ ගිණුමටත්, අවසාන තොග ශේෂය කාර්යාලීය උපකරණ නඩත්තු ගිණුමටත් වශයෙන් ගිණුම් 02 ක් තුළට ඇතුළත් කර තිබීමෙන් තොග වටිනාකම් නිවැරදි ක්‍රමවේදයක් යටතේ ගිණුම්ගත කර නොමැති බවට නිරීක්ෂණය විය. | 2024 අවසන් ගිණුම් සැකසීමේ දී මෙම වියදම් ශීර්ෂයන්හි අගයයන් නිසි පරිදි නැවත සැකසීමටත්, ඉදිරියේ දී මෙවැනි අතපසු වීම් මඟහරවා ගැනීමටත් කටයුතු කරමි. | තොග වටිනාකම් නිවැරදි ක්‍රමවේදයක් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ විධායක නොවන නිලධාරීන් සඳහා අනුමත වැටුප් හා දීමනාවලට අමතරව වෙනත් කිසිදු දීමනාවකට 2016 අප්‍රේල් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 යටතේ හිමිකම් නොතිබුණ ද, දිනකට රු.200 ක් බැගින් වූ සහන දීමනාවක් 2019 අගෝස්තු සිට විගණිත දින දක්වාම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව ගෙවා තිබුණු අතර 2023 වර්ෂය සඳහා පමණක් ගෙවන ලද එම දීමනාව රු.27,849,400 ක් විය. | අධිකාරියේ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා 02/2016 යටතේ සිදුව ඇති වැටුප් විෂමතාවය අවම කිරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය යටතේ මෙම ගෙවීම සිදු කරනු ලබයි. මෙම ගෙවීම පහළ මට්ටමේ සේවකයින් හට ගෙවනු ලබන වැටුප් හා සෘජුව සම්බන්ධ වූ ගෙවීමක් වුවත් අධිකාරියේ ඉපැයීම මගින් මෙම දීමනාව ගෙවීම සිදු කිරීමත් මහා භාණ්ඩාගාරයෙන් මේ සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් නොකිරීමත් මත පදනම්ව ගමන් වියදම් යටතේ මේ සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරනු ලබයි. | චක්‍රලේඛ මඟින් අනුමත වැටුප් හා දීමනාවලට අමතරව වෙනත් දීමනාවන් නොගෙවිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට රු.119,306,403 ක් වූ ලැබිය යුතු මුදල් වටිනාකම තුළ වසර 05 ක් ඉක්මවූ රු.141,856 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණි. | අධිකාරියේ නිලධාරීන් සඳහා ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා ගෙවූ අත්තිකාරම්, සේවය අතහැර ගිය සේවකයෙකුගෙන් අය විය යුතු ණය ශේෂයකින් සහ වෙනත් අත්තිකාරමකින් මෙම ශේෂය සමන්විත වන අතර අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අයවිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු දැ රු.422,794,332 ක් තුළ නිරවුල් කිරීමට කටයුතු නොකළ වසර 05 ඉක්ම වූ රු.208,486,003 ක් ද, වසර 03 - 05 දක්වා වූ රු.49,488,942 ක් ද, වසර 02 – 03 දක්වා වූ රු.33,518,659 ක් ද විය. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 89 ඡේදය ප්‍රකාරව ගෙවිය යුතු දැ එක් රේඛීය අයිතමයක් වශයෙන් පෙන්වනවා වෙනුවට ගෙවිය යුතු ගිණුම් වශයෙන් රු. 283,520,408 ක් ද, උපචිත වියදම් වශයෙන් රු.139,273,924 ක් ද ලෙස රේඛීය අයිතම 02 ක් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි. | රේඛීය අයිතමයක් ලෙස ගෙවිය යුතු ගිණුම් ශේෂය පෙන්විය යුතු වුවත්, පරිශීලනයේ පහසුව මත උපචිත වියදම් වෙන්වූ අගයක් ලෙස මේ වන තෙක් දක්වා ඇත. ගෙවිය යුතු ශේෂ තුළ ඇතුළත් EIA ව්‍යාපෘති යෝජකයින් විසින් ව්‍යාපෘති වාර්තා ලබාගැනීම සඳහා වූ තැන්පතු මුදලින් තවදුරටත් ක්‍රියාත්මක ව්‍යාපෘති සළකා බලා 2024 වර්ෂයේදී ගිණුම්වලට ගැලපීමට ද, විවිධ පාර්ශවයන්ගෙන් රඳවා ගත් ටෙන්ඩර් තැන්පතු, කාර්යසාධන බැදුම්කර සහ විවිධ තැන්පතු පරිපාලන අංශය මඟින් විමසීම් කර ගිණුම්වලින් ගැලපීමට ද නියමිතය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව එක් රේඛීය අයිතමයක් ලෙස පෙන්විය යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2000 අංක 53 හා 1998 අංක 56 දරන පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රය | | | |

| | | | |
|---|---|---|---|
| i. | පවත්නා ගැසට් පත්‍රය මඟින් ආවරණය නොවන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්ෂේත්‍ර සම්බන්ධව කාලීනව ගැසට් පත්‍ර මඟින් ප්‍රසිද්ධ කර යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණු බවටත්, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට අදාළව පළාත් පාලන ආයතන වෙත වගකීම පවරා ඇති ආයතන සම්බන්ධව පසුවිපරම් කාර්යයක් හෝ නියාමන කාර්යයක් කර නොමැති බවටත් නිරීක්ෂණය විය. | ගැසට් පත්‍රය යාවත්කාලීන කිරීම සඳහා මේ වන විට විවිධ පාර්ශව මඟින් ලබා දෙන අදහස් සහ යෝජනා රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කෙරේ. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ගැසට් නිවේදනයෙහි නාමිකව සඳහන් නොකළ ද එහි සිදුවන ක්‍රියාවලීන්වල වැඩ මුර සඳහා සිටින සේවක සංඛ්‍යාව පදනම් කොටගෙන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සිදුකළ හැකිය. පළාත් පාලන ආයතන වෙත වගකීම පවරා ඇති "ඇ" කාණ්ඩයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත් කර්මාන්ත සම්බන්ධව පරිඝණක දත්ත පද්ධතියක් ආරම්භ කර පවත්වාගෙන යන අතර එමඟින් අවශ්‍යතාවය අනුව අදාළ කර්මාන්ත නියාමනය හා පසු විපරම් කරනු ලබයි. | අවශ්‍ය යාවත්කාලීන කිරීම් කඩිනමින් සිදුකළ යුතු අතර ප්‍රමාණවත් පසුවිපරමක් පවත්වා ගත යුතුය. |
| ii. | යම් ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කිරීමට පූර්වයෙන් නියමිත ප්‍රමිතීන්වලට අනුකූලව එකී අපද්‍රව්‍ය මුදා හැරීම/ තැන්පත් කිරීම හෝ වායුමෝචනයන් ශබ්දය පිට කිරීමට අදාළව අපද්‍රව්‍ය මෝචනය/ බැහැරලීම් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු වුවත් එලෙස බලපත්‍රයක් ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන උතුරුමැද හා බස්නාහිර පළාත් කාර්යාලයන්හි අධීක්ෂණයේ පවතින ව්‍යාපාර පිළිවෙළින් 32 ක් හා 11 ක් ද, මහනුවර හා මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයන්හි අධීක්ෂණයේ පවතින ව්‍යාපාර පිළිවෙළින් 203 ක් හා 26 ක් ද ලෙස ව්‍යාපාර 272 ක් නිරීක්ෂණය වූ අතර ඒ තුළ ව්‍යාපාර කටයුතු ආරම්භ කර වසර 1 ½ ක සිට වසර 28 ක කාලයක් ඉක්ම වූ ව්‍යාපාරත්, ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂය හඳුනා නොගත් ව්‍යාපාරත් පැවතීමෙන් | මෙයින් බොහෝමයක් ව්‍යාපාර කටයුතු පරිසර ආරක්ෂණ ක්‍රියාවලියට ඇතුළත් කර පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමේ ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | පරිසර ආරක්ෂණ බලපත්‍ර නොලබා ව්‍යාපාර කටයුතු සිදුකරන ව්‍යාපාර සම්බන්ධයෙන් නීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අධිකාරිය විසින් අවශ්‍ය පියවරයන් කාලීනව ගෙන නොතිබීම නිරීක්ෂණය විය. | | |
| iii. | | වලංගු කාලසීමාව ඉක්මවීමට මාස 03 කට පෙර ඉල්ලුම් කර පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අලුත් කර ගත යුතු නමුත්, මාතලේ, දඹුල්ල, කොළඹ, මහනුවර, මොණරාගල සහ අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ව්‍යාපාර 396 ක් 2024 මැයි 20 වන විටත් බලපත්‍ර අලුත්කර නොතිබුණු අතර ඉන් ආයතන 101 ක් වෙත සිහිකැඳවීම් හෝ යවා නොතිබුණි. තවද, ව්‍යාපාර 10 ක් බලපත්‍ර අලුත්කර නොගෙන මාස 03 ක සිට අවුරුදු 02 ක් දක්වා දිගු කාලයක් ව්‍යාපාර කටයුතු ඉටු කර පසුව බලපත්‍ර අලුත්කර තිබුණි. | කාර්යාලීය දත්ත පද්ධතිය භාරව සිටින නිළධාරියාට, සෑම මසකම අවසාන සතියේ ඉදිරි මාස 03 ක් ඇතුළත කල් ඉකුත්වන කර්මාන්ත ලේඛනය සියළුම නිළධාරින් වෙත යොමු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, EPL දත්ත පද්ධතිය හරහා තොරතුරු යාවත්කාලීන කර නියමිත කාල සීමාව තුළදී අදාළ සිහිකැඳවීම් සිදු කරන අතරම දුරකථන මාර්ගය ඔස්සේ ද කර්මාන්තකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලබයි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අඛණ්ඩව අළුත් කර ගැනීමට අවශ්‍ය නියාමනය සිදු කළ යුතුය. |
| iv. | | පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබූ මාතලේ සහ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකට අයත් කළුගල් ඩොලමයිට් කැනීම් කර්මාන්ත 10 ක්, අප ජලය ජල මූලාශ්‍ර වෙත මුදාහරිනු ලබන කර්මාන්ත 03 ක්, අපද්‍රව්‍ය ප්‍රතිකර්මයකින් තොරව බාහිර පරිසරයට මුදාහැර තිබූ කර්මාන්ත 02 ක්, නියමිත ප්‍රමිති හා උපමානවලට අනුකූලව කටයුතු කර නොතිබුණු කොළඹ දිස්ත්‍රික්කයේ කර්මාන්ත 07 ක් සහ විශ්ලේෂණ වාර්තා, කැණීම් බලපත්‍ර වැනි පූර්වයෙන් ඉදිරිපත් කළ යුතු වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබූ කර්මාන්ත 25 ක් කොන්දේසි හා නියමයන් කඩකිරීම සම්බන්ධව අධිකාරිය විසින් අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි. | පරිසර දූෂකාරක පාලනයට ප්‍රමාණවත් කාලසීමාවන් තුළ කටයුතු නොකරන ලද අවස්ථාවලදී ක්‍රියාත්මක විය යුතු ආකාරය හා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් දැනුවත් කරන ලද අතර අවශ්‍ය පරිදි සිහිකැඳවීම් කර කර්මාන්තකරුවන්ගේ ප්‍රතිචාර මත නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු කර්මාන්ත සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරනු ලැබේ. | බලපත්‍රයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව කටයුතු සිදු නොකරන කර්මාන්ත සම්බන්ධයෙන් නීති ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග කාලීනව ගත යුතුය. |
| (ආ) | 2002 අංක 14 දරන (සංශෝධිත) එකතු කළ අගය මත බදු පනතේ 26 වන වගන්තිය | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ එකතු කළ අගය මත බදු මුදල් රු.59,642,609 ක් නියමිත කාල සීමාව තුළ නොගෙවීම මත රු.15,846,897 ක දඩ මුදලක් | 2018 සිට 2022 දක්වා කාලය තුළ එකතු කළ අගය මත බද්ද සඳහා තක්සේරු වාර්තා සම්පූර්ණ කිරීමේදී සිදු වූ අඩුපාඩු | එකතු කළ අගය මත බදු මුදල් නියමිත කාල සීමාව තුළ ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පනවා තිබූ බවට නිරීක්ෂණය විය. | හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති අතර දේශීය ආදායම් කොමසාරිස් වෙත අභියාචනාවක් ඉදිරිපත් කර ඇත. | |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 1:2 හා 13, 14, 21 හා 24 ඡේද | නිලධාරීන් අතින් සිදුවන්නා වූ කවරාකාරයකින් දඬුවම් පැමිණ විය යුතු වූ සියලුම විෂමාචාර ක්‍රියාවන් හෝ ප්‍රමාද දෝෂයන් හෝ සම්බන්ධයෙන් විනය නියමයන්ට අනුකූලව හැකිතාක් ඉක්මනින් විනය බලධාරීන් විසින් ක්‍රියාකළ යුතු වුවද, 2008 වර්ෂයේ වැඩබලන අධ්‍යක්ෂවරයෙකු හා 2016 වර්ෂයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කළ නිලධාරියෙකු සම්බන්ධයෙන් මූලික විමර්ශන මගින් අනාවරණය කරගෙන තිබුණු චෝදනාවන් සම්බන්ධයෙන් අදාළ වන දඬුවම් නියම කිරීමට කටයුතු නොකර ඔහුව මානව සම්පත්, පරිපාලන හා මූල්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට උසස්කර තිබුණි. | 2024 මාර්තු 30 දින සිට විශ්‍රාම ලබා ඇති මෙම නිලධාරියා 2016 වසරේ වයඹ පළාත් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කිරීමේදී වූ මෙම සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා පත්‍ර ලබාදී විධිමත් විනය පරීක්ෂණයක් සිදුකළ යුතු බවට අදාළ මූලික විමර්ශනය මගින් නිර්දේශ කර නොතිබූ බැවින්, විනය බලධාරීයා විසින් තරයේ අවවාදාත්මක ලිපියක් නිකුත් කර ඇත. අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව මෙම නිලධාරියාට උසස් කිරීම් ලබා දී ඇත. | මූලික විමර්ශන මගින් අනාවරණය කරගෙන තිබුණු චෝදනාවන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 103 සහ 104 | වාහන අලාභහානි 04 කට අදාළව රු.257,984 ක මුදලක් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමටත්, අධිකාරි භූමිය තුළ ගාල් කර තිබූ කැබ් රථයක ඉන්ධන අස්ථානගත වී මාස 05 ක් ඉක්මවා තිබුණ ද ඒ සම්බන්ධ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමටත්, වාහන අලාභහානි අවස්ථා 06 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමටත්, සහ අදාළ හානි පාඩු ලේඛනයේ සටහන් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | අලාභ සම්බන්ධයෙන් වගකීම් නිශ්චය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. විමර්ශන අවසන්ව ඇති අනතුරු සම්බන්ධයෙන් නිර්දේශ ක්‍රියාත්මක වෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ කඩිනමින් අය කිරීමටත් පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීමටත් පූර්ණ වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කිරීමටත් අදාළ හානි පාඩු ලේඛනයේ සටහන් ඇතුළත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| ii | මුදල් රෙගුලාසි 388 (3) | "ආදායකයාගේ ගිණුමට පමණකි" යනුවෙන් වූ රේඛනය අවලංගු කර 2023 අගෝස්තු 16 දින දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නමින් එකතුව රු.3,364,297 ක මුදල් චෙක්පත් 02 ක් නිකුත් කර තිබුණි. | එම චෙක්පත් නිසි පරිදි රේඛනය කර ඇති බවට නිවැරදි නොවන ආකාරයට අදහස් දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායකයාගේ ගිණුමට පමණක් චෙක්පත් නිකුත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) | එක් එක් මුදල් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත්කිරීම අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් 15 ට පෙර සිදුකළ යුතු වුවත් 2022 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2023 මැයි 19 වන දින පත්කර තිබුණු අතර ඊට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමටත්, 2023 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කිරීමටත් කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනයට අවසන් කිරීමට සේවක සංඛ්‍යාවෙහි පවතින ඌණතාවය සෘජුව බලපා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධ නිසි අභ්‍යන්තර පාලනයක් ඇති කළ යුතුය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 17 දිනැති අංක 22/2023 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ව්‍යවස්ථාපිත ආයතන ආමන්ත්‍රණය කර නොමැති මෙම චක්‍රලේඛය පදනම් කරගෙන අධිකාරියේ නිලධාරීන්ට 2023 වර්ෂය වෙනුවෙන් රු.896,400 ක විශේෂ අත්තිකාරම් ගෙවා තිබුණි. එසේම එම චක්‍රලේඛ විධිවිධාන අනුව 2023 වර්ෂය තුළදීම එම මුදල අයකර ගත යුතු වුවද, රු.99,600 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවතුණු අතර වසර 05 ක් ඉක්මවා හිඟ හිට තිබූ රු.75,058 ක විශේෂ අත්තිකාරම් මුදලක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ නිලධාරීන් හඳුනා ගෙන එම මුදල් වහාම අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. | චක්‍රලේඛ ප්‍රතිපාදන යටතේ පමණක් විශේෂ අත්තිකාරම් ගෙවිය යුතු අතර හිඟ හිට ඇති මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛය හා 2023 මාර්තු 14 දිනැති PED 02/2023 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | පුනරාවර්තන වියදම් වලින් සියයට 6 ක ප්‍රමාණයක් ඉතිරිකළ යුතු වුවද, 2023 වර්ෂය සඳහා සැපයුම් සහ නඩත්තු වියදම් යන වැය විෂයයන් 02 සඳහා රු.1,148,000 ක අධි වැයක් දරා තිබුණි. | ඉන්ධන හා ගමන් වියදම්වල මිල ඉහළ යාම හා ලිපිද්‍රව්‍යවල මිල ඉහළ යාම, වාහන අළුත්වැඩියාව සඳහා අනපේක්ෂිත ලෙස මුදල් වැය වීම මේ සඳහා හේතු විය. | චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ඉතිරිවීම් පවත්වා ගත යුතුය. |
| (ඌ) | 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | පෞද්ගලික ජංගම දුරකථන, නිවාස සහ අන්තර්ජාල පහසුකම් සඳහා 2022 ජනවාරි සිට 2022 ජූලි දක්වා හිටපු සභාපතිවරයාට සහ නිලධාරීන් 65 දෙනෙක් සඳහා නියමිත දීමනාව නොගෙවා තත්‍ය බිල්පත් සම්පූර්ණයෙන් ගෙවා තිබීමෙන් එකතුව රු.918,255 ක් චක්‍රලේඛ ප්‍රතිපාදන ඉක්මවා වැඩිපුර ගෙවා තිබුණි. | දුරකථන වියදම් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට නියමිතයි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ඉක්මවා කරන ලද ගෙවීම් නැවත අයකළ යුතුය. |
| (එ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක PED 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අධිකාරිය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීම් සිදුකර තිබුණ ද 2022 වර්ෂයේ ඉතිරි කරගත් නිවාඩු සඳහා රු.34,342,812 ක් ගෙවා ඇති බවට විමසුම් මඟින් පෙන්වා දී තිබියදීත් 2023 වර්ෂයේ ඉතිරිකරගත් නිවාඩු | මෙම අධිකාරියේ නිලධාරීන්ට ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කර ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 ජනවාරි 16 | චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව හිමිකම් නොමැති ගෙවීම් නැවත අයකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සඳහා ද රු.30,947,878 ක දීමනා ගෙවා තිබුණි. | දිනැතිව ලබාදී ඇති විශේෂ අනුමැතිය මතවේ. අධිකාරියේ ඉපයීම් වලින්, ඉතිරි වෛද්‍ය නිවාඩු උපරිම දින 21 කට යටත්ව මෙය ගෙවා ඇත. | |
| (ඒ) | අධිකාරියේ කාර්ය මණ්ඩල බඳවාගැනීමේ පරිපාටිය | අධිකාරියේ බඳවාගැනීම් දිනට බලාත්මකව පැවති බඳවාගැනීමේ පරිපාටියට ඇතුළත් මූලික සුදුසුකම් සපුරා නොතිබු ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 04 දෙනෙකු 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ බඳවාගෙන මේ වන විට රාජකාරි කටයුතු සිදුකරමින් පවතී. | මෙම සියළු පත්කිරීම් බඳවාගැනීම් පටිපාටිය අනුව අදාළ වන පරිදි මූලික තරඟ විභාග සහ සුදුසුකම් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ පවත්වා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත තෝරාගෙන ඇත. | අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.100,819,908 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 48,482,055 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.149,301,963 ක වර්ධනයක් නිරීක්ෂණය විය. අධිකාරියේ ආදායම සියයට 47 කින් ඉහළ යාම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් 2016 දෙසැම්බර් 21 දිනැතිව පෞද්ගලික සමාගමක් සමඟ එළඹී තිබූ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව පාරිසරික සහ සමාජ ව්‍යාපෘති සඳහා වසර 03 ක කාලයකට රු.මිලියන 150 ක ප්‍රාග්ධන ප්‍රදානයක් අදියර 03 ක ව්‍යාපෘති ලෙස ලබා දීමට ඇතිකර ගත් එකඟතාවය අනුව පළමු අදියරේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 වර්ෂයේදී වත්කම් හා නඩත්තු වැය ලෙස රු.මිලියන 50 ක් ලබාදී තිබුණු අතර 2019 දෙසැම්බර් 20 දිනෙන් අවසන් වූ ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට අධිකාරිය කටයුතු නොකිරීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ ඉතිරි රු.මිලියන 100 ක මුදල අහිමි වී තිබුණි. | මෙම අවබෝධතා ගිවිසුම දීර්ඝ කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව, අදාළ සමාගම විසින් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසු 2023 ජූනි 13 දිනැතිව අධිකාරිය වෙත එවා ඇත.<br>කෙසේ වුවද, රුපියල් මිලියන 100 ක ඉතිරි ප්‍රතිපාදනයෙන් ජල තත්ත්ව කළමනාකරණය සහ පසුවිපරම් ක්‍රියාවලීන් යටතේ වන වෙනත් අත්‍යාවශ්‍ය ව්‍යාපෘති සඳහා යෙදවීමේ අවශ්‍යතාවයක් යෝජනා වීමෙන් අදාළ අවබෝධතා ගිවිසුම නැවත සකස් කර අවශ්‍ය ව්‍යාපෘති ඇතුළත් නව ගිවිසුම සඳහා ඉදිරි කටයුතු ක්‍රියාත්මක වීම් සිදුවේ. | නව ගිවිසුම අත්සන් කර එකඟ වූ පරිදි සියලු ප්‍රතිපාදන ලබාගෙන අදාළ ව්‍යාපෘති සාර්ථකව ක්රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මානව සම්පත් තොරතුරු පද්ධතියක් මාස 03 ක් තුළදී ස්ථාපිත කිරීම සඳහා 2018 දෙසැම්බර් 27 දින රු.1,845,000 කට පෞද්ගලික ආයතනයක් සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව රු.369,000 ක අත්තිකාරම් මුදලක් ලබාදී සමාලෝචිත වර්ෂය වන විට වසර 05 ක් ඉක්මවා ගොස් තිබුණ ද, අදාළ පද්ධතිය ස්ථාපිත කර නොතිබුණු අතර ඊට අදාළ බැංකු ඇපකරය හා කාර්ය සාධන සුරක්ෂණය ද කල් ඉකුත් වී තිබුණි. ඊට අදාළ රු.184,500 ක ප්‍රමාද ගාස්තුව අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියට ගැලපෙන අයුරින් මොඩියුල සකසා ගැනීමට හා පසුගිය වසංගත කාලය තුළ දත්ත ඇතුළත් කිරීමේ යම් ප්‍රමාදයන් හේතුවෙන් සැපයුම්කරු හා අධිකාරිය අතර ඇති වූ එකඟතාවය මත අදාළ කටයුතු සිදු වූ නිසා ප්‍රමාද ගාස්තු අය කර නොමැත. මෙම පද්ධතියේ පවතින ගැටළු සහගත තත්වයන් හේතුවෙන් සැපයුම්කරු වෙත ගිවිසුමේ ප්‍රකාරව කටයුතු කර මෙම පද්ධතිය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්නේද යන්න තීරණය කිරීමට නියමිතය. | බැංකු ඇපකරය හා කාර්ය සාධන සුරක්ෂණය අළුත් කර අවශ්‍යතාවය පරිදි පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 – 2019 කාලපරිච්ඡේදය තුළ මිලදීගත් අයිතම් වර්ග 15 කට අයත් රු.803,444 ක් වටිනා ඒකක 382 ක් ද, වටිනාකම තහවුරු කර ගැනීමට නොහැකි වූ අයිතම් වර්ග 31 කට අයත් ඒකක 3129 ක් ද, වශයෙන් චලනය නොවන තොග අයිතම් වර්ග 46 කින් ඒකක 3,511 ක් ප්‍රධාන කාර්යාල ගබඩාව තුළ පැවතුණි. | භාවිතා කළ නොහැකි තොග ඉදිරියේදී අපහරණය කිරීමටත්, අවශ්‍යතා සැළකිල්ලට ගෙන ඉතිරි තොග නිකුත් කිරීමටත් නියමිතය. | චලනය නොවන තොග අවශ්‍ය පරිදි භාවිතා කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උතුරු මැද පළාත් කාර්යාල රසායනාගාරයේ මෙහෙයුම් කටයුතු උදෙසා උපයෝජනය කරනු ලබන රසායනික ද්‍රව්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයකට අපහරණය කිරීමට කටයුතු නොකර වසර 06 කට වැඩි කාලයක සිට භාවිතයෙන් ඉවත් කර රසායනාගාරයේ ගබඩා කර ඇති බවටත්, වසර 10 කට පමණ ප්‍රථම ලබාදී තිබූ නමුත් වසර ගණනාවක සිට උපයෝජනය නොකරන උපකරණ 03 ක් සහ රසායනාගාර උපකරණ 30 ක් අලුත්වැඩියා කර නැවත උපයෝජනය කිරීමට හෝ විධිමත්ව අපහරණය කිරිමට හෝ කටයුතු කර නොතිබූ බවටත් නිරීක්ෂණය විය. | විද්‍යාගාරයේ උපයෝජිත රසායනික ද්‍රව්‍ය සියල්ල ප්‍රධාන කාර්යාලය වෙත යවා විධිමත්ව අපහරණය සඳහා කටයුතු සකස් කර ඇත. උපයෝජනය නොකරන විද්‍යාගාර උපකරණ ප්‍රධාන කාර්යාලය වෙත යැවීමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවති . | අලුත්වැඩියා කර නැවත උපයෝජනය කිරීමට හෝ විධිමත්ව අපහරණය කිරීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |